SEASL Seafood Exporters' Association of Sri Lanka

# නිල් කකුළුවෝ පුවත් හසුන අංක 2

***2014 ජූලි දෙසැම්බර් කලාපය***

***ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනය කරුවන්ගේ සංගමයේ (එස් .ඊ .ඒ .එස්. එල්) අනුග්‍රහය ඇතිව*** සංස්කරනය කරනු ලබන නිල් කකුළුවෝ පුවත් හසුනෙහි දෙවන කලාපය ඔබවෙත ඉතාමත්ම සාදරයෙන් පිලිගන්වනු කැමැත්තෙමි. පසුගිය මාස 6 ක පමන කාලය ප්‍රධාන රාජකාරී කටයුතු දෙකක් නිසා ඉතාමත්ම අවිවේකී ලෙස ගෙවුනි. එනම් එක් පැත්තකින් ***සංක්‍රමණිකයන් සඳහා වූ අන්තර් ජාතික සංවිධානයේ (අයි.ඕ.එම්)*** මූල්‍ය අනුග්‍රහය ඇතිව පුත්තලම කලපුව ආශ්‍රිත නිල් කකුළුවන් බෝවීම් අනුපාතය ධීවර කටයුතු තිරසාර ලෙස කරගෙන යාම සඳහා කොපමන තරමකට යහපත් මට්ටමක පවතින්නේද යන්න පිළිබදව කරන ලද සමීක්ෂණය නිම කරන ලදී . දෙවනුව ***ජාතික ජලජ සම්පත් සංවර්ධන සහ පර්යේක්ෂන ආයතනයේ( නාරා ආයතනය)*** මැදිහත් වීම තුල යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක ආශ්‍රත වෙරළ තීර වල නිල් කකුළුධීවර කර්මාන්තයේ සංවර්ධනයට අදාලව ජෛව විද්‍යාත්මක පර්සරය තක්සේරු කිරීම පිළිබදව දිගු කාලීන පර්යේක්ෂණ කටයුතුද නිමකර ඇත. මෙම පර්යේක්ෂණ කටයුතු වලට අමතරව කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූන්කරි ධීවර සමුපකාර සමිතියේ මැදිහත්වීම හරහා බෙන්ගාල බොක්ක සාගර තීරයේ නිල්කකුළු වන්බෝවීමේ හැකියාව ආශ්‍රිත වර්ථමාන තත්වය පිලිබදවද අධ්‍යන කටයුතු නිම කරන ලදී .මෙම පුවත් හසුන තුලින් මෙම සියලුම අධ්‍යනයන්ගේ ප්‍රතිඵල පිළිබදවද තොරතුරු හෙලිදරව් කිරීමට අපේක්ෂා කරමු.

***පුත්තලම කලපුව ආශ්‍රිත නිල් කකුළු ධීවර කටයුතු පිළබදව සිදුකරන ලද පර්යේක්ෂණය :*** පුත්තලම කලපුව ගත්කල ශ්‍රිලංකාව ආශ්‍රිත නිල්කකුළුවන් බෝවන ප්‍රධානතම සාගර තීර දෙකෙන් එකක්ලෙස සැලකිව හැකිය. සංක්‍රමණිකයන් පිළිබ දඅන්තර්ජාතික සංවිධානයේ අනුග්‍රහය ලබාගැනීමෙන් සහ මුහුදු ආහාර අපනයනය කරුයන්ගේ සංගමයේ උපදේශකත්වයෙන් මෙම ධීවර කටයුතු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේද දායකත්වයෙන් මෙම පර්යේක්ෂණ කටයුතු 2014 වර්ෂයේ ජූනි සිට දෙසැම්බර්දක්වා කාලය තුළදී සිදුකරන ලදි.




පාලකුඩා ආනවාසල සහ බත්තලන්ගුංඩුව යන ප්‍රදේශයන්හි වෙසෙන ධීවර ජනතාවගේ සහයෝගයෙන් මෙම පර්යේක්ෂණ කටයුතු ක්ෂේත්‍ර මට්ටමෙන් සිදුකරන ලද අතර ශ්‍රී ලංකාව පැත්තෙන් සලකා බලන විට මෙබදු පර්යේක්ෂන ක්‍රියාවලියක් සිදුකරන ලද ප්‍රථම අවස්ථාව වශයෙන්ද සදහන් කලහැකිය. මෙසේ ක්ෂේත්‍රයෙන් රැස්කරගන්නාලද දත්ත විශලේෂණය කරන ලද්දේ බටහිර ***ඕස්ට්‍රේලියාවෙහි මොනෑෂ් විශ්ව විද්‍යාලයේ විශේෂඥයින් දෙපලක් වන ආචාර්ය්‍ය ඇඩ්රීන් හාඩියැක් සහ ආචාර්ය්‍ය ජෛරම්ප්‍රන්ස්*** යන මහතුන් විසින්ය. මෙම මූලික පර්යේක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහත සදහන් කරනලද අනුපාතයයේ අගයේ අගය 0.46 ක් ලෙස හදුනාගෙන ඇති අතර ජාත්‍යන්තර සාගර භාරකාරත්ව ආයතනය මගින් ප්‍රකාෂිත දත්තයන් අනුව සැසදීමේදී මෙම අගය ස්ථිරසාර අගයක් ලෙස ප්‍රකාෂයට පත්කල හැකිය.





මෙම පර්යේක්ෂණ කටයුතු වලට සමගාමීව පාලකුඩා ආනවාසල සහ බත්තලංගුණ්ඩුව යන කලපු සහ මෝය කලාප ආශ්‍රිතව තවත් කාර්ය්‍යයන් කිහිපයක්ම සංක්‍රමණිකයන් පිළිබද අන්නර්ජාත්ක සංවිධානයේ අනුග්‍රහය ඇතිව ඉටු කරන ලදී එනම් ට්‍රෝලර් යාන්ත්‍රික ධීවර කටයුතු පිටුදැකීමේ වැඩසටහන සහ කංගුස් දැල් ඇතුලත්ව තහනම් දැල්පන්න භාවිතය පිටු දැකීමේ වැඩසටහන ආදිය සදහන් කල හැකිය. ඒ අනුව ධීවර පවුල් 33 ක් සදහා දැනට ඔවුන් භාවිතා කරන තංගුස්දැල් පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේද මැදිහත් වීම හරහා විනාශ කොට නිත්‍යානුකූල දැල් පන්න ලබාදීමද සිදුකරන ලදී .



***ධීවර කටයුතු සංවර්ධන ව්‍යාපෘතිය සහ එහි කළමනාකරණ කටයු:*** ශ්‍රී ලංකාවෙහි නිල්කකුළු ගහනය ආශ්‍රිත ජෛවවිද්‍යාත්මක පර්යේක්ෂණයන් ඉටුකිරීමත් අස්වැන්නේ පලදායීතාවය කළමනාකරන කටයුතු සිදුකිරීමත් සහ ජාත්‍යන්තර ප්‍රමිතින් පිළිපැදීමත් මෙම වැඩසටහනේ මූලික ඉලක්කය වන්නේය. මෙහිදී විශේෂයෙන්ම සලකාබලන කරුණක් වන්නේ නිල් කකුලුවන්ගේ බෝවීමේ හැකියාව පිලිබදව සැලකිලිමත්වන පර්යේක්ෂණ කටයුතුය . පුත්තලම කලපුව තුල අල්ලාගනු ලබන



නිල්කකුලුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් බිත්තර දමනතෙක් වර්ධනය නොවූ සලකාබලන ප්‍රමාණයට වඩා දිගින් සහ බර ප්‍රමාණයෙන් අඩු සතුන්බවට අපවිසින් රැස්කරගන්නාලද දත්ත පරීක්ෂා කර බලන ලද විශේෂඥයින් දෙපලක් වන ආචාර්ය ඇඩ්රින් හාඩියැක් සහ ආචාර්ය ජෙරම්ප්‍රන්ස් යන මහතුන්ගේ පර්යේක්ෂණය තුලින් අවධාරනය කොට ඇත . දැනට දකුණු ආසියානු සහ ආසියානු කලාපය තුල මෙම තත්වය වර්ධනය වුවහොත් එය නිල් කකුලු ධීවර කර්මාන්තය කෙරෙහි එය ඉදිරියේදී ප්‍රභල අභියෝගයක් වන්නටද පිලිවන.



2014 ඔක්තෝබර් මාසයේදී ***නාරා ආයතනයේ ප්‍රධානි හපුතංත්‍රී මහතා ඇතුලු පර්යේක්ෂන කණ්ඩායමක්*** මගින් යාපනය අතුලත්වන පරිදි උතුරු මුහුදේ නිල් කකුලුවන්ගේ ජීවන චක්‍රය සහ පැවැත්ම හා බැදි සාගර ජෛවවිද්‍යාත්මක පරිසරය පිළිබදව තක්සේරු කිරීම උදෙසා වර්ෂය පුරාම දිවෙන පර්යේක්ෂණ ක්‍රියාවලියක් අරබා ඇත. මෙම පර්යේක්ෂණයේදිද නාරා ආයතනය වැඩි අවධානය යොමුකරඇත්තේ පෙර අධ්‍යනයේදී මෙන්ම කකුලුවන්ගේ දිග බර පර්ණතත්වය බෝවන කාලසීමාව සහ මත්ෂ්‍ය ආහාර දාමයන් ඇතුලත් සාගර ජෛවවිද්‍යාත්මක සාදක වන අතර මෙම කරුණු නිල් කකුළු වන්ගේ ජීවන චක්‍රයේ පැවැත්ම සදහා කෙතරම් දුරට ඉවහල්වන්නේද යන්න පිලිබද මෙම ධීවර කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ පාර්ෂවකාර ආයතන සහ සංවිධානයන් වෙත දැනුවත් කිරීමය. ඒ අනුව නාරා ආයතනයේ මෙම පර්යේෂණයේ මූලික වාර්ථාව 2015 මාර්තු මස අවසානයේදී පමන හෙලිදැක්වීමට නියමිතය.



2015 දෙසම්බර් මාසයේදී ඉටුකරන ලද තවත් වැදගත් කටයුත්තක් වූයේ පුත්තලම සහ කල්පිටිය මෝය කලාපයේ ***අනවසර ට්‍රෝලර්යාත්‍රා යොදාගැනීම වැලැක්වීමේ*** වැඩසටහනේමූලික පියවර ලෙස ධීවර කටයුතු සංවර්දනය කිරීමේ ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් ***පරිසර සංරක්ෂන භාරය*** සමග එක්ව දියත්කරන ලද වැඩසටහය. මෙහි ඊලග වීයවර වන්නේ ධීවර ප්‍රජාවගේමූලික අයිතිවාසිකම් කඩවන ආකාරයේ ක්‍රියාදාමයක් සිදුවන බව හැගීයන හෙයින් නීති ***ධීවර සංවර්ධන වැඩසටහනේ ජ්‍යෙෂ්ඨ නිළධාරි වීවර් රිසව්*** සහ මෙරට නීති විශාරදයන්ගේද උපදෙස් පරිදි නෛතික ක්‍රියාමාර්ග වලට එලබීමට අදහස් කර ඇත්තෙමු.

එමෙන්ම දෙසැම්බර් මස අවසානයේදී සිදුකරනලද තවත් වැදගත් කටයුත්තක් වූයේ මෙරට ප්‍රමුඛ පෙලේ මුහුදු ආහාර අපනයනය කරන සමාගම් වන ඇල්ෆෙක්ස් මැරින් , සිලෝන් ෆිෂ් , තම්බපන්නී ශීෆුඩ් , යන සමාගම් සමග එකාබද්ද වීමෙන් එෆ්අයිපි නොහොත් ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ 2015 සැලැස්ම පිළිබදව දැනුවත්කිරීමේ වැඩසටහන පවත්වන ලදි. මෙහිදී අවධාරනය කරන ලද තවත් කරුණක් වූයේ නිල් කකුලු ආශ්‍රිත මුහුදු ආහාර නිශ්පාදන ක්‍රියාවලියෙහි තිරසාර බව දකුණු ආසියාවෙහි නිශ්පාදන සදහා ඇමරිකානු විකල්ප වෙළදපල ක්‍රියාමාර්ග සොයාබැලීම සහ මෙතුලින් අදාල සමාගම් සදහා ලබාගතහැකි සෘජු සහ වක්‍ර ප්‍රතිලාභ කවරේද යනාදි කරුණු පිළිබදවය.


මෙහිදී තවත් අවධාරණයට ලක්වූ කරුණක් වන්නේ මුහුදු ආහාර නිශ්පාදනවල තිරසාර බවට අමතරව තවත් වෙළදනාම ඇසුරෙන් අලුත් නිශ්පාදන පිළිබදව ගවේශණය කිරිම ආදී කරුණුය. මෙම රැස්වීම නිම වූයේ අපගේ ධීවර කටයුතු සංවර්දනය කිරීමේ ව්‍යාපෘතිය සදහා තවදුරටත් අඛණ්ඩව සහයෝගිත්වය ශ්‍රී ලංකා මුහුදු ආහාර නිශ්පාදන සංගමයට 2015 වර්ෂයතුලදීත් ලබාදීම පිළිබදව ප්‍රතිඥව ලබාදීමත් සමගය.

මෙම ධීවර සංවර්ධන ව්‍යාපෘතියට අදාලව ප්‍රදාන සියලුම ලිපිලේඛන ආදිය ලෙස සකනු ලබන තුන් අවුරුදු වැඩසටහනේ තර්කරාමු විග්‍රහය, වාර්ෂික සැලසුම, අයවැය ,ඇතුලත් මූල්‍ය තොරතුරුද කාර්යදර්ශක ඇගයීම සහ නියාමනය පිලිබදව සියලුවාර්ථා අප සතුව පවතින අතර(www.seasl.lk) යන වෙබ් අඩවියට පිවිසීමෙන් මෙම සියලු තොරතුරු ලබාගතහැකිය. තවද මෙම ව්‍යාපෘතියේ කටයුතු සහ මෙතෙක් ලගාකරගත් ඉලක්ක වල නිරවද්‍යභාවය යන කරුනු තුන්වෙනි පාර්ශවයක් මගින්ද තහවුරු කරනු ඇත.

## *ධීවර කටයුතු සංවර්ධනය කිරීම පිළිබඳ උතුරු ප්‍රදේශයේ ක්‍රියාත්මක වැඩසටහන .*


ඉන්දියන් සාගරයේ පෝක් සමුද්‍ර සංධිය ආශ්‍රිත මුහුදු කලාපයෙන් අඩක් ඉන්දියාව සතුවන අතර අනිත් අර්ධය තුල ධීවර කටයුතු සිදුකරනු ලබන්නේ යාපනය කිලිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වල වෙසෙන ධීවර ප්‍රජාව විසිනි. මෙම කලාපයේ පවත්නා සාගර ජෛවවිවිධත්ව සාධක නිල්කකුළුන් සිඝ්‍රයෙන් බෝවීමට ඉවහල් වී ඇත . ඒ අනුව ***අන්තර් ජාතික කම්කරු සංවිධානයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක ලීඩ් ව්‍යාපෘතිය*** මගින් කිලිනොච්චිය පූනාකාරි ධීවර සමුපකාර සංගමයේ හවුල්කාරත්වය යටතේ දැනට ක්‍රියාත්මකවෙයි මෙම වැඩසටහන මගින් මෙම ප්‍රදේශයේ ධීවර ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම මූල්ක වශයෙන් ඉලක්කය කරගෙන ඇත.






මෙම කිලිනොච්චිය ප්‍රදේශයේද ධීවර සමුපකාර සංගමය සහසම්බන්ධ කරගනිමින් නිල්කකුලුවන්ගේ බෝවීමේ අනුපාතය තක්සේරු කිරීම ආශ්‍රිත අධ්‍යන කටයුතු පසුගිය නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී සිදුකරන ලද අතර මෙම පර්යේක්ෂණ කටයුත්ත සඳහා ***කකුලුවන් 6000 ක ප්‍රමාණයක*** දිග සහ බර මැනීමත් ස්ත්‍රි පුරුෂ භාවය සහ පරිණත ලක්ෂණ පිළිබඳව පර්යේක්ෂන කටයුතු නිමකරන ලදි. මෙසේ ක්ෂේත්‍රයෙන් රැස්කරගන්නාලද දත්ත විශලේෂණය කරන ලද්දේ බටහිර ඕස්ට්‍රේලියාවෙහි මොනෑෂ් විශ්ව විද්‍යාලයේ විශේෂඥයින් දෙපලක් වන ***ආචාර්ය ඇඩ්රින් හාඩියැක් සහ ආචාර්ය පේරම්ප්‍රන්ස්*** යන මහතුන්ය මෙම මූලික පර්යේක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහත සඳහන් කරනලද අනුපාතයේ අගය 0.46 ක් ලෙස හඳුනාගෙන ඇති අතර ජාත්‍යන්තර සාගර භාරකාරත්ව ආයතනය මගින් ප්‍රකාශිත දත්තයන් අනුව සැසඳීමේදී මෙම අගය ස්ථිරසාර අගයක් ලෙස ප්‍රකාෂයට පත්කල හැකිබව සඳහන් කර ඇත. තවද පසුගිය දෙසැම්බර මාසයේදී පූනක්කාරි ධීවර සමුපකාර සංගමය මගින් යාපනය කිලිනොච්චි සහ මන්නාරම යන දිස්ත්‍රික්ක වල වෙසෙන ධීවර සමිති නායකයන් සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් දියත්කරන ලදී මෙම වැඩසටහන් වල මූලික අරමුන වූයේ නිල්කකුලු ධීවර කර්මාන්තයේ සංවර්දනය උදෙසා ඉවහල්වන ජෛවවිද්‍යාත්මක සහ පාරිසරික සාදක සංවර්ධනය කලයුත්තේ කෙසේද යන්න්ය මෙම වැඩමුලුව තුළින් සහභාගිවූ ධීවර නායකයින් විසින් දැනට මෙම කර්මාන්තය කෙරෙහි ඇති ගැටලු සහ ඉදිරි අභියෝග පිළිබඳව දීර්ග වශයෙන් සැලකිල්ලට භාජනය කරන ලදි ***මෙම ලීඩ් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය අනුග්‍රහය ලැබෙන්නේ එක්සත් ජාතින්ගේ සංවිධානය සමග අනුබද්ධ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ඕස්ට්‍රේලියානු අන්තර්ජාතික සංවර්ධන සංගමයේ ප්‍රජා පුණරුත්ථාපන වැඩසටහනේ තුන්වැනි පියවර යටතේ අනුමත කරඇති මල්‍ය ප්‍රතිපාදන යටතේය.***






පසුගිය ඔක්තෝබර්මාසය තුලදී ***ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන දෙපාර්ථමේන්තුව විසින් බෙංගාල බොක්ක සංවර්ධන වැඩසටහන*** යටතේ පාරිසරික සංවර්ධනයට අදාලව ව්‍යාපෘති වාර්ථාවක් ඉදිරිපත් කරන ලදි . ඒයටතේ ධීවර සංවර්ධන දෙපාර්ථමේන්තුවේ අධ්‍යක්ෂජෙනරාල් වන නිමල් හෙට්ටිආරච්චි මහතා විසින් මුහුදු ආහාර නිශ්පාදන කරුවන්ගේ සංගමයට මෙන්ම නාරා ආයතනයේ පර්යේක්ෂ්නණ නිළධාරින් සඳහා ආරාධනාකරමින් සඳහන්කරන ලද්දේ මෙම ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා පාර්ෂවකරුවන් ලෙස මෙම ආයතනවලද සහයෝගය ලබා දෙන ලෙසටය . මෙම ව්‍යාපෘතිය යටතේ දෙපාර්ථමේන්තු නිළධාරින් සහභාගි කරගනිමින් දිස්ත්‍රික්ක 4 ක්තු ළ ක්‍රියාත්මකවන සමීක්ෂනයක් පැවැතවීමට යෝජිතය. මෙම සමීක්ෂන ප්‍රතිතල පදනම් කරගනිමින් නිල්කකුලු ධීවර කටයුතු කළමනාකරණ සැලැස්මක් සැකසීම සඳහා ධීවර කටයුතු සංවර්දන දෙපාර්ථමේන්තුව අදහස්කොට තිබේ. මෙම කටයුතු සඳහා තාක්ෂනික දායකත්වය ලබාදීමට තීරණය කර ඇත්තේ ***වයඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය සෙව්වන්දි ජයකොඩි*** මහත්මිය විසිනි .

***2015 වර්ෂය සඳහා වූ ධීවර සංවර්ධන ව්‍යාපෘතියට අදාල  වැඩසැලසුම්:*** ඒ අනුව 2015 වර්ෂය සදහාද  මෙම ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අදහස්කර ඇත.  මෙයට සහයෝගය ලබාදුන් අනිකුත් සියලුම ආයතන වන සංක්‍රමණිකයන් පිළිබදවූ අන්තර් ජාත්ක ආයතනය , අන්තර් ජාතික ධීවර කටයුතු සංවර්ධන ආයතනයේ කකුළුවන් පිළිබදවන සභාව, අන්තර් ජාතික කම්කරු සංවිධානය  බෙංගාලබොක්ක වැඩසටහන, යන සියලුම ආයතනවල සහයෝගිතාවයද සහ දායකත්වය මෙයට ලැබෙනු ඇත .

## 1 වන කාර්තුව තුල ක්‍රියාත්මක  කිරීමට යෝජිත ඉලක්ක

***මුහුදු ආහාරනිශ්පාදන සහ සුරක්ෂිතතාවය:*** පිළිබද වැඩසටහන  දිගටම පවත්වාගෙන යාම
***මුහුදු ආහාරනිශ්පාදන තිරසාරතාවය සහ බෙදාහැරීම*** පිළිබදව කාර්යක්ෂම  ක්‍රියාමාර්ග සහ තවදුරටත් වැඩිදියුණු කිරිම.
***සාගර භාරකාරීත්ව සංගමය*** මගින් දියත්කරනු ලබන තාක්ෂණික පුහුණු වැඩසටහන් තවදුරටත් දියත් කිරිම.
***පුනක්කාරි ධීවර සංගමය විසින් ෆෝක්සමුද්‍ර සංධිය ආශ්‍රිතව*** දියත් කරනුලබන පර්යේක්ෂන කටයුතු  තවදුරටත් සිදුකිරිම
දැනට  සිදුකරනු ලබන **තහනම් ට්‍රෝලර්  යාන්ත්‍රික කටයුතු අත්හිටුවීම** පිණිස අදාල ක්‍රියාමාර්ග ගැනීම.
**නාරාආයකනය මගින් කරනලද පර්යේක්ෂණ කටයුතු** වලට අදාලව පිලියල කරනලද  අර්ධ වාර්ෂික වාර්ථාව ප්‍රසිද්ධකිරිම
මුහුදු ආහාර නිශ්පාදන කරුවන්ගේ සංගමයේ ***දෙවන ක්‍රියාකාරී කමිටු රැස්වීම*** පැවැත්වීම.
2015 /2016 වර්ෂ සදහා අයවැය ***සංගමයේ අරමුදල ඇමරිකානු ඩොලර්  100000 ක්*** (එක් ලක්ෂයක්) දක්වා වර්ධනය කිරිම.

## 2 වන කාර්තුව  සදහා  යොජිත ඉලක්ක

***පර්යේක්ෂණ වාර්ථා ප්‍රසිද්ධියට පත්කිරිම*** - *නිල් කකුලුවනගේ බෝවීම පිළිබද තක්සේරු වාර්ථාව ,ධීවර  කටයුතු පිලිබද  නිල්කකුලු ධීවර කටයුතු ආශ්‍රිතව තත්ව සමීක්ෂන වාර්ථාව ,  ගිල් නෙට් වැඩසටහන ආශ්‍රිත වාර්ථා නිල් කකුළු ධීවර කටයුතු ආශ්‍රිත අස්වනු කළමනාකරණ  උපාය මාර්ග ආශ්‍රිත  දළ වාර්ථාව.*

නිල් කකුලු ධීවර කටයුතු සංවර්ධනය පාරිසරික තත්ව සංවර්ධනය සහ කලමනාකරණ කටයුතු ආශ්‍රිතව ව්‍යාපෘතිවාර්ථා දෙකක් පිළයල කිරිම.
*තොරතුරු සහ ලේ ලිපිලේඛන යාවත්කාලීන කිරිම.*

## 3 වන කාර්තුවට අදාල වන ඉලක්ක

***ආචාර්ය්‍ය ජෙරොම් ප්‍රින්සි සහ හෝඩියෝක් ශ්‍රී ලංකාවට පැමිනීම*** : සහ  කකුලුවන්ගේ බෝ බෝවීමේ අනුපානය ගනනය කිරිම ආශ්‍රිත පර්යේක්ෂන ක්‍රියාවලියට අදාල තාක්ෂණික පුහුණුකිරිම.
**අස්වනු කලමනාකරණ  උපාය මාර්ග** වලට අදාලව පිලිපැදිය යුතු නිර්නායකයන් නිශ්චය කිරිම.

## 4 වන කාර්තුවට අදාලව ඉලක්ක

**කකුලුවන්ගේ බෝ බෝවීමේ අනුපානය ගනනය** කිරිම ආශ්‍රිත  වාර්ෂක පර්යේක්ෂන කටයුතු.
**සහතික කරන ක්‍රියාවලිය** ආශ්‍රිත  ක්‍රියාකාරි මණ්ඩල නිර්ණය කරිම.
***තොරතුරු සහ ලේ ලිපිලේඛන යාවත්කාලීන කිරිම***

***ධීවර කටයුතු සංවර්ධන ව්‍යාපෘතිය යනු කුමක්ද :***  සරළවශයෙන් සදහන් කලොත් මෙම ව්‍යාපෘතිය හරහා මුලික වශයෙන් බලාපොරොත්තු වන්නේ මුහුදු ආහාර නීහ්පාදයන කරනු ලබන්නන්ගේ සංගමයේ සාමාජික සමාගම් වල සහ නිල් කකුළුවන් ආශ්‍රිත ධීවර කර්මාන්තයේ තිරසාර සංවර්දනය උදෙසා දියත් කරනු ලබන නිශ්පාදන  ක්‍රියාවලින් නෛතික රාමුව ආරක්ෂාකිරිම, ආහාර සැකසුම් ක්‍රියාවලියට අදාල  සමස්ත  කොටස්කරුවන් වන නිෂ්පාදක පිරිස් , අලෙවිකරුයන් සහ අනිකුත් සාමාජික ආයතන සමගින් අත්වැල් බැදගනිමින් දියත්වන  අඛන්ඩ ක්‍රියාවලියකී . වන අතර මෙහිදී පහත සදහන් අංශකෙරෙහි වැඩි අවදානයක් යොමුකරනු ලබයි. ***නිශ්පාදය***  මෙහිදී මුලික වශයෙන් ධීවර සමිති සාමාජික ප්‍රජාව සහ  සැකසුම් කරනු ලබන සමාගම් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. ***නීති රෙගුලාසි*** මෙහිදී අවධානය යොමුකරනු ලබන්නේ  නීති රීති සම්පාදනය කරනුලබන සහ එම ක්‍රියාවලියට දායක වන රාජ්‍ය අංශය කෙරෙහිය.  ***සාමාජිකත්ව සහ හවුල්කරුවන්***  මෙහිදී අවධානය යොමුකරනු ලබන්නේ  සමස්ථ ක්‍රියාවලිය කෙරෙහි දායකත්වය දක්වන පාර්ෂවකරුවන් පිලිබදය .  ***ඒකාබද්ධ තාවය*** .මෙහිදි අවධානය යොමු කරනු ලබන්නේ මෙම වැඩපලිවල අන්තර් ජාතින වශයෙන් පිලිගන්නා ප්‍රමිතීන්ට අනුකූලව  දියත් කිරිමට  සහ අධීක්ෂන ක්‍රියාවලියට දායකත්වය සලසන ආයතන පිලිබදවය.

තමම සියලුම කරුණු අනුව සලකා බැලීමේදී  නිල් කකුළු ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතියේ මූලික අභිප්‍රය වන්නේ  ඉහත සදහන් සියලුම නිර්නායකයන් රෙගුලාසින් සහ පිලිගත් සම්මුතින්ට අනුකූලව  මෙම කර්මාන්තය පවත්වාගෙන යාමත් මෙම කර්මාන්තයට සෑම ආකාරයක්න්ම සම්බන්ධ වන පාර්ෂවකරුවන්ගෙන් සමන්විත කළමනාකරන ක්‍රියාලියක් ඔස්සේ දිගින් දිගටම පවත්වාගෙන යාමය